# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2113/68 – 2019 මාර්තු මස 08 වැනි සිකුරාදා – 2019.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**දකුණු පළාතේ පළාත් සභාව**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව**

2019 අංක .... දරන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත

දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍ය හේවා ගම්පලගේ මනෝජ් සිරිසේන වන මම මෙහි පළකරනු ලබන 2019 අංක ....... දරන දකුණු පළාතේ පළාත් සභාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත මෙම ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට සති දෙකක් ඉකුත් වීමෙන් පසු දකුණු පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳ ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක.

**එච්. ජී. මනෝජ් සිරිසේන,**<br>
ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස් බල හා රැකිරක්ෂා අමාත්‍ය,<br>
දකුණු පළාත් සභාව.

2019 පෙබරවාරි මස 01 වැනි දින,<br>
ගාල්ල.<br>
දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍ය කාර්යාලයේ දී ය.

**2019 අංක ......... දරන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත**

දකුණු පළාතේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, පරිපාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ නීති ප්‍රඥප්ති කෙටුම්පතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවන දිනය

01. මෙම නීති ප්‍රඥප්ති කෙටුම්පත දකුණු පළාත් සභාවේ 2019 අංක .......... දරන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත ලෙස හඳුන්වනු ලබන අතර, එය (මින් ඉදිරියට, ''ක්‍රියාත්මකවන දිනය'' වශයෙන් හඳුන්වනු ලබන) දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වේ.

ප්‍රඥප්තියේ අරමුණු

02. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු ය.

*(අ)* (මින් ඉදිරියට, ''දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්'' යනුවෙන් හඳුන්වනු ලබන) වයස මාස හතරේ සිට අවුරුදු දොළහ දක්වා වූ සීමාවේ ළමයින්ට තම නිවෙස්වලින් බැහැරව දවසේ යම් කිසි කාල සීමාවක් තුළ රැකවරණය සැලසීම මගින් ළමයින්ගේ සුරැකුම් හා වර්ධනය සඳහා දෙමව්පියන්ට සහයවන පළාතේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධව සම්පූර්ණ අධීක්ෂණයක් පවත්වාගෙන යාම හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ රැඳී සිටින කාලය තුළ දරුවන්ගේ සම්පූර්ණ වගකීම භාර ගැනීම සහ;

*(ආ)* පළාත ඇතුළත දිවා සුරැකුම් මධ්‍යස්ථානවල දරුවන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා ඉවහල්වන පරිසරයක් ඇති කිරීම.

1 වන කොටස

***මෙහෙයුම් මණ්ඩලය පිහිටුවීම, බලතල සහ කාර්යයන්***

මෙහෙයුම් මණ්ඩලය පිහිටුවීම

03. (මින් ඉදිරියට, ''මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන) මෙහෙයුම් මණ්ඩලයක් ප්‍රඥප්තියේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය හා ධුර කාලය

04. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

*(අ)* නිල බලයෙන් පත් වූ සාමාජිකයන් වන-

(i) සභාපතිවරයා විය යුතු පළාතේ සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ;

(ii) ලේකම්වරයා විය යුතු පළාතේ සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාගෙන් ;

(iii) පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ;

(iv) පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ;

(v) පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගෙන් ;

(vi) නියෝජ්‍ය/සහකාර පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගෙන් ;

(vii) නියෝජ්‍ය /සහකාර සමාජ සුභසාධන අධ්‍යක්ෂවරයාගෙන් ;

(viii) ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධරයන් තිදෙනාගෙන් ;

(ix) ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධරයන් තිදෙනාගෙන් ;

(x) ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධරයන් තිදෙනාගෙන් ; සහ

(ආ) (මෙහි මින්මතු ''පත්කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) (මින් ඉදිරියට ''අමාත්‍යවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) පළාතේ විෂයය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු තැනැත්තන් තිදෙනෙකුගෙන් ;

(2) යම් තැනැත්තෙකු

(අ) පාර්ලිමේන්තුව හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සඳහා මහජන ඡන්දයෙන් පත් වූ හෝ වෙනත් ආකාරයකින් පත් වූ සභිකයෙකු වේ නම්, හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ සිහිවිකල තැනැත්තෙකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම්, හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටින ලද හෝ යටත්ව සිටින තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ බුන්වත් තැනැත්තෙකු හෝ නොබිඳුණු බංකොලොත්කරුවකු ලෙස ප්‍රකාශයට පත්කරන ලද තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

(ඉ) මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අගතිදායක ලෙස බලපෑ හැකි යම් මුල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇති තැනැත්තෙකු වී ඇත්නම්, හෝ
ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

(3) නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයකු ම ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් ධුරයක් ප්‍රකාරවද, එම ධුරය දරන තාක්කල් මණ්ඩලයේ ධුරය දැරිය යුතුය.

(4) (අ) පත්කළ සෑම සාමාජිකයෙක් විසින්ම ඔහු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ස්වකීය ධුරය, කලින් හිස්කරනු ලැබුවහොත් මිස, ඒ ධුරයට පත් කරනු ලැබූ දින පටන් අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් අස්කරනු ලැබුවහොත් මිස නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් එසේ කිරීම සුදුසු යැයි සලකනු ලබන විටදී, හේතු දක්වා යම් පත්කළ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(ඇ) යම් පත්කළ සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා අමතා ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් කවර අවස්ථාවක දී වුව ද ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(ඈ) පත්කළ යම් සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ධුරය හිස්කරනු ලබන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිය. එසේ පත්කරනු ලබන යම් සාමාජිකයෙකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතුය.

5. මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ නීති කෘත්‍යයක් මණ්ඩලයේ පුරප්පාඩුවක්, හෝ එහි යම් සාමාජිකයෙකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතුය. — පුරප්පාඩුවක් ඇති වීමේ හේතුවෙන් ක්‍රියා නිර්බල නොවන බව

6. මණ්ඩලයේ සාමාජිකයන්ට, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය. — මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

7. (1) මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙන් මාස තුනකට වරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වුවද, මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු යැයි අමාත්‍යවරයා විසින් හෝ යටත් පිරිසෙන් මණ්ඩලයේ සාමාජිකයන් හත්දෙනෙකු විසින්වත් මණ්ඩලයේ ලේකම්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම්, ඒ ඉල්ලීමේ දින සිට දින හතක් ඇතුළත ඔහු විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය. — මණ්ඩලයේ රැස්වීම්

(2) මණ්ඩලයේ ලේකම්වරයා විසින් මණ්ඩලයේ එක් එක් සාමාජිකයා වෙත, යටත් පිරිසෙන් රැස්වීමට දින හතකටවත් පෙරාතුව රැස්වීම පිළිබඳව ලිඛිතව දැනුම් දිය යුතුය.

(3) යම් රැස්වීමක ගණ පූරණය සාමාජිකයන් හත් දෙනෙකු විය යුතුය.

(4) සභාපතිවරයා විසින් මණ්ඩලයේ මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් නිල බලයෙන් පත්කළ සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරාගනු ලැබිය යුතුය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්ද පිළිබඳ සමානතාවක් ඇති වූ විටෙක, රැස්වීමේ මුලසුන දරන තැනැත්තාට, තම ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතුය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට, යටත්ව රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකිය.

මණ්ඩලයේ කාර්යය

8. මණ්ඩලය පහත කාර්යයන් ඉටු කරනු ලැබිය යුතුය.

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රමිතිය නංවාලීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ අවශ්‍ය සහය ලබාදීම.

(ආ) දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය අවම ප්‍රමිතීන් රීති මගින් නියම කිරීම.

(ඇ) දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයට තිබිය යුතු අවම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් රීති මගින් නියම කිරීම.

(ඈ) විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා රැකවරණය සැළසීමේ දී අවශ්‍ය වන ප්‍රමිතීන් රීති මගින් නියම කිරීම.

(ඉ) මෙම ප්‍රඥප්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය රීති සෑදීම.

## 11 වන කොටස

## දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම

දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම

(9) (1) මින් මතු නිර්වචනය කරනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම් විසින් එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතියෙන් වූ අයදුම්පතක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) (1) වැනි උප වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා අයදුම්කරනු ලබන සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්ම මෙම ප්‍රඥප්තියේ නියම සහ කොන්දේසිවලට යටත් වන්නේ දැයි සලකා බැලීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකන යම් තොරතුරු හෝ ලේඛන කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් කැඳවනු ලැබිය හැකිය.

ලියාපදිංචිය සඳහා වූ අවශ්‍යතා

(10) (1) දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා වූ (මින් ඉදිරියට ''කමිටුව'' යනුවෙන් හඳුන්වනු ලබන) සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරුවලින් සමන්විත පාලක මණ්ඩලයක් සිටිය යුතුය.

*(අ)* යම් තැනැත්තෙකු

(i) පාර්ලිමේන්තුව හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සඳහා මහජන ඡන්දයෙන් පත් වූ හෝ වෙනත් ආකාරයකින් පත් වූ සභිකයෙකු වේ නම්, හෝ

(ii) අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ළමා කටයුතු සම්බන්ධව රාජකාරි සඳහා පත්කරනු ලැබූ නිලධරයෙකු හෝ පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු සම්බන්ධ අධීක්ෂණ හෝ රාජකාරි කටයුතුවල නියැලෙන රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක, ආයතනයක හෝ අධිකාරියක නිලධරයෙකු හෝ පොලිස් නිලධරයෙකු වේ නම්, හෝ

(iii) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ සිහිවිකල තැනැත්තෙකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම්, හෝ

(iv) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් ව සිටින ලද හෝ යටත් ව සිටින තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

(v) ළමා අපයෝජන හෝ අපචාර සිදුවීමකට චෝදනා ලැබ අධිකරණයක් මගින් විධිමත් නඩු විභාගයකින් පසු නිදොස් කොට නිදහස් කරනු නොලැබූ තැනැත්තෙකු නම්, හෝ

(vi) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ බුන්වත් තැනැත්තෙකු හෝ නොබිඳුණු බංකොලොත්කරුවකු ලෙස ප්‍රකාශයට පත් කරන ලද තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

(vii) කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අගතිදායක ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇති තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

ඔහු කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේය.

(ආ) කමිටුවේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තිදෙනෙකුවත් දිවා සුරැකුම් මධ්‍යස්ථානය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිකරුවන් විය යුතු ය.

(ඇ) කමිටුවේ සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත් දිවා සුරැකුම් මධ්‍යස්ථානයට පැමිණෙන ළමයින්ගේ මව්පියන් විය යුතු අතර අදාළ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ප්‍රධාන පාලිකාව කමිටුවේ ලේකම් විය යුතු ය.

(2) කලින් කලට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන, 8 වැනි වගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදයන්හි සඳහන් පරිදි මණ්ඩලය විසින් රීති මගින් නියම කර ඇති ප්‍රමිතීන්වලට අනුකූලව දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කටයුතු කළ යුතු ය.

11. කොමසාරිස්වරයා වෙත අයදුම්පතක් ලද විටක හෝ අනුමැතියකින් තොරව දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවට පැමිණිල්ලක් ලද විටක හෝ පරිවාස නිලධරයකුට හෝ කොමසාරිස්වරයා විසින් බලය පවරන වෙනත් යම් නිලධරයෙකුට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සති හතරක් ඇතුළත වාර්තාවක් ලබාදෙන ලෙස නියම කළ යුතු ය; වාර්තා ලබා ගැනීම.

(අ) එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ළමයින්ගේ උපරිම සුබසිද්ධිය හා රැකවරණය එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය මගින් සැලසෙන්නේ ද යන්න සම්බන්ධව;

සහ

(ආ) 10 (1) සහ 10 (2) වැනි උපවගන්ති යටතේ කර ඇති නියම සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකර ඇත් ද යන්න සම්බන්ධව,

(i) 10 (2) වැනි උපවගන්තිය යටතේ නියම කර ඇති ප්‍රමිතීන්වලින් සියයට පනහක්වත් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ii) ඉතිරි ප්‍රමිති අවශ්‍යතාවන් දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමෙන් පසු වසර දෙකක් ඉකුත් වීමට පෙර සපුරාලීමට එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් විසින් කොමසාරිස්වරයා සමග ගිවිසුමකට එළඹිය යුතුය.

12. 11 වැනි වගන්තිය යටතේ වූ වාර්තාව ලද පසු, එහි නේවාසිකව සිටින ළමයින්ගේ සුබසිද්ධිය හා රැකවරණය එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය මගින් සැලසෙන්නේ ද සහ අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකර තිබේදැයි පරීක්ෂා කර බැලීම සඳහා ඕනෑම අවස්ථාවක දී එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයට ඇතුළුවීමට කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයකුට හැකිය. පරීක්ෂණය සිදුකිරීම.

13. 12 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයෙන් පසුව කොමසාරිස්වරයා විසින් සාධාරණව සෑහීමට පත්වන්නේ නම් අයදුම්පත ඉදිරිපත් කර මාස හයක් ඇතුළත එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට ලියාපදිංචි කිරීම.

කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය.

ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

14\. (1) දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු කොමසාරිස්වරයා විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත නිකුත් කළ යුතුය. එවැනි සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු විය යුතුය.

(2) 11 ආ (ii) අනුඡේදය යටතේ වූ ගිවිසුමකට එළඹෙන අවස්ථාවක දී මාස හයක කාලයක් සඳහා වලංගු වන තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතුය.

(3) (1) හා (2) වැනි උප වගන්තීන් යටතේ නිකුත් කරනලද කිසිදු ලියාපදිංචි කිරීමේ සහතිකයක් වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර ඒ අනුව එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බල රහිත වන්නේය.

(4) (1) හා (2) වැනි උප වගන්තීන් යටතේ නිකුත් කරන ලද සෑම සහතිකයක් ම, ඒ සහතිකය මගින් බලය දෙනු ලැබ ඇති තැනැත්තා විසින් ප්‍රධාන කාර්යාලයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම අවස්ථාවකදී ම ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

(5) තමා විසින් තාවකාලික ලියාපදිංචි සහතිකයක් හෝ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම මගින් ලියාපදිංචි කරන ලද සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් ම, එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ නම, ලිපිනය, ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය සහ කොමසාරිස්වරයාට අවශ්‍යයැයි හැඟී යන වෙනත් තොරතුරක් වේ නම් ඒවාද ඇතුළත් නියමිත ආකෘතියෙන් යුත් ලේඛනයක් කොමසාරිස්වරයා විසින් පවත්වා ගෙන යා යුතුය.

(6) කොමසාරිස්වරයා තමා විසින් (1) හා (2) වැනි උප වගන්තීන් යටතේ ලියාපදිංචි කරන ලද දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වාර්තාවක් අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලයේ රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

ලියාපදිංචි වීමේ අයදුම්පතෙහි විස්තර වල ඇති යම් වෙනසක් කොමසාරිස්වරයා වෙත දැනුම්දිය යුතු බව.

15\. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් දරන සෑම තැනැත්තෙක් විසින් ම, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා වූ තම අයදුම් පත්‍රයෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් සිදුවුවහොත් එම වෙනස පිළිබඳ එය සිදු වී දින තිහක් ඇතුළත කොමසාරිස්වරයාට දැනුම් දිය යුතුය.

සහතිකය අළුත් කිරීම.

16\. (1) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

(අ) බලාත්මකව පවතින කාලසීමාව ඉකුත්වීමට ලිත් මාස තුනකට පෙරාතුව වූ කාලසීමාව ඇතුළත ලියාපදිංචියේ දී සපයා ඇති තොරතුරුවල කිසියම් වෙනස් කිරීමක් තිබේ නම් එය සංක්ෂිප්තව දක්වමින් නියමිත ආකෘතියෙන් යුත් අයදුම්පත්‍රයක් මගින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කළ යුතුය.

(ආ) නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකුල බවට කොමසාරිස් සෑහීමකට පත්වන්නේ නම්, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව ලියාපදිංචිය අළුත් කරදිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

(අ) බලාත්මකව පවතින කාලසීමාව ඉකුත්වීමට ලිත් මාසයකට පෙරාතුව වූ කාලසීමාව ඇතුළත ලියාපදිංචියේ දී සපයා ඇති තොරතුරුවල කිසියම් වෙනස් කිරීමක් තිබේ නම් එය සංක්ෂිප්තව දක්වමින් නියමිත ආකෘතියෙන් යුත් අයදුම් පත්‍රයක් මගින් තාවකාලික ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කළ යුතුය.

(ආ) නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකුල වීමට අවශ්‍ය සාධක සම්පූර්ණ කිරීමේ ප්‍රගතියක් පෙන්වන බවට කොමසාරිස් සෑහීමකට පත් වන්නේ නම්, මාස හයකට වලංගු වන පරිදි තාවකාලික ලියාපදිංචිය අළුත් කර දිය යුතුය. මෙසේ ගිවිසුම්ගත කාලය අවසන් වන තෙක් වූ කාලසීමාව තුළ දී තාවකාලික ලියාපදිංචිය සෑම මාස හයකට වරක් ම අළුත් කරගැනීමට කටයුතු කළ යුතුය.

17. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, තමා විසින් ලියාපදිංචි කරන ලද දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට පහත දක්වෙන බලතල තිබිය යුතුය. කොමසාරිස්වරයාගේ බලතල.

(අ) දවසේ යම් යුක්ති සහගත වේලාවක් තුළ දී දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වනු ලබන ස්ථානවලට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීම;

(ආ) පළාත ඇතුළත යම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම්වරයාට වාර්තා සහ තොරතුරු ලබාදෙන ලෙස නියම කිරීම;

(ඇ) පළාත ඇතුළත පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම;

(ඈ) කොමසාරිස්වරයා සාධාරණව සෑහීමකට පත්වන්නේ නම් දිවා සුරැකුම් මධ්‍යස්ථානවල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය අවස්ථාවල දී ආධාර ලබාදීම;

(ඉ) දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මේ ප්‍රඥප්තිය මගින් කොමසාරිස්වරයා වෙත පවරනු ලැබ ඇති බලතලවලින් යම් බලයක් තමා යටතේ රාජකාරි කරනු ලබන යම් නිලධරයෙකුට පැවරීම අවශ්‍ය බවට කොමසාරිස්වරයා විසින් සලකනු ලබන්නේ නම්, කොමසාරිස්වරයා විසින් එවැනි යම් බලයක් එකී නිලධරයෙකුට පවරනු ලැබිය හැකිය.

18. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින පටන් හා ඉන්පසුව, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක බලය යටතේ සහ එහි නියම හා කොන්දේසිවලට අනුකූලව හැර, කිසිම තැනැත්තෙකු විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතුය. ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යා නොහැකි බව.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින පටන් මාස හයක කාලසීමාවක් සඳහා එය පවත්වා ගෙන යනු ලැබිය හැකි නමුත්, එකී මාස හයක කාල සීමාව ඉකුත්වීමට පෙර ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්කර මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ සහතිකයක් ලබාගත යුතුය.

19. 11 වැනි වගන්තිය යටතේ වූ වාර්තාව ලද පසුව 12 වගන්තිය යටතේ සිදු කරන පරීක්ෂණයෙන් අනතුරුව 10(1) හා 10(2) වැනි උපවගන්තීන් යටතේ වූ ඡේද හා අනු ඡේද යටතේ සඳහන් වන අවශ්‍යතා සපුරා නොමැති බව සනාථ වුවහොත්, එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කළ නොහැකි බවට කොමසාරිස්වරයා විසින් කමිටුවේ ලේකම්වරයාට ලිඛිත ව දැන්විය යුතුය. ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප වීම.

20. කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවන යම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම්වරයෙකුට ඒ දැන්වීමේ දින සිට දින දාහතරක් ඇතුළත (මින් ඉදිරියට ''අමාත්‍යාංශ ලේකම්වරයා'' ලෙස හඳුන්වනු ලබන) පළාතේ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව.

21. (1) අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් පත්කරන කොමසාරිස්වරයාගේ තනතුරට සමාන හෝ කොමසාරිස්වරයාගේ තනතුරට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතුය. අභියාචන පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය.

(2) පරීක්ෂණයෙහි තීරණය පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව හේතු එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත ලිඛිතව දන්වා යැවීම;

(ආ) දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමසාරිස්වරයා වෙත දැනුම් දීම;

(ඇ) 10 (1) හා 10 (2) වැනි උප වගන්තීන් යටතේ වූ ඡේද හා අනු ඡේද යටතේ සඳහන් වන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට වසරකට නොවැඩි සහනදයි කාලසීමාවක් ලබාදීම සහ එසේ සපුරාලන්නේ නම් ඉන් අනතුරුව දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම අනුමත කරන ලෙස කොමසාරිස්වරයාට දැනුම් දීම.

අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව.

22. 21 වැනි වගන්තිය යටතේ දෙන ලද තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශවකරුවෙකු විසින් ඒ තීරණයේ දින සිට දින දහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

අභියාචන පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය.

23. 22 වැනි වගන්තිය යටතේ අභියාචනයක් ලද විටකදී, අමාත්‍යාංශ ලේකම්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ඒ අභියාචනය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර එම පරීක්ෂණයේ වාර්තාව අනුව අමාත්‍යවරයා විසින් 21 (2) (අ), (ආ) හෝ (ඇ) උපවගන්ති අනුව තම තීරණය ලබා දිය යුතුය.

ලේකම්වරයා කමිටුව වෙනුවෙන් කටයුතු කළ යුතු බව.

24. දිවා සුරැකුම් මධ්‍යස්ථානයට අදළ සියලු කාරණා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමග කටයුතු කිරීමට හැකියාව ඇති එකම තැනැත්තා එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්වරයා වන්නේ ය.

## III වන කොටස

### *දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පරිපාලනය හා ඊට අදළ අනෙකුත් කරුණු*

උපදෙස් අනුගමනය කළ යුතු බව සහ නියෝග ක්‍රියාත්මක කළ යුතු බව.

25. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සිටින ළමයින්ගේ සුබසිද්ධිය හෝ එහි පරිපාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයෙකු විසින් හෝ දෙනු ලබන උපදෙස් හෝ නියෝග එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්, කමිටුව සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය අනුගමනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

තොරතුරු සහ වාර්තා සැපයිය යුතු බව.

26. (1) කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධරයෙකු විසින් ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ සඳහන් කාල සීමාව ඇතුළත දී යම් තොරතුරු හෝ වාර්තා සපයන ලෙස දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත නියම කරනු ලැබිය හැකිය.

(2)එම තොරතුරු හෝ වාර්තා සැපයීමේ දී දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් විසින් වැරදි හෝ ව්‍යාජ තොරතුරු සැපයීමෙන් වැළකී සිටිය යුතුය.

## IV වන කොටස

### *දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අවලංගු කිරීම*

ලියාපදිංචිය අවලංගු කිරීම.

27. පහත සඳහන් අවස්ථාවලදී කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් පැවත්වීමෙන් අනතුරුව කොමසාරිස්වරයා විසින් සාධාරණ ව සෑහීමකට පත්වන්නේ නම් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ බහුතර සාමාජික සංඛ්‍යාවකගේ ඡන්දයෙන් එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට නොහැකි බවට යෝජනාවක් සම්මත කර ඒ බව ලිඛිතව කොමසාරිස්වරයා වෙත දන්වන ලද අවස්ථාවක දී;

(ආ) සහතිකය දරන්නා හෝ කමිටුව හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ විධිවිධානයක් උල්ලංඝණය කර ඇති බවට හෝ කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු විසින් දෙනු ලබන උපදෙස් හෝ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හැර ඇති බවට හෝ නියම කරනු ලබන තොරතුරු හෝ වාර්තා සැපයීම පැහැර හැරීම හෝ වැරදි හෝ ව්‍යාජ තොරතුරු සපයා ඇති බවට කොමසාරිස්වරයා සෑහීමකට පත් වුවහොත් කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් සහතිකය දරන්නාට ලබා දීමෙන් අනතුරුව;

(ඇ) ඉහත 14(2) වැනි උප වගන්තිය යටතේ තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිකුත් කර ඇති අවස්ථාවක, 11(ආ)(ii) අනු ඡේදය යටතේ කොමසාරිස්වරයා සමග ගිවිසුම්ගත වූ කාලසීමාව ඉකුත් වුව ද අපේක්ෂිත ප්‍රමිතීන් සම්පූර්ණ කර නොමැති අවස්ථාවක දී;

28. 27 (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ කිසියම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කිරීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් එම තීරණයට එළඹුන දින සිට දින තිහක් ඇතුළත ඒ බව දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේ දැන්වීම.

29. කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචිය අවලංගු කිරීමේ දැන්වීම සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවන යම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම්වරයෙකුට ඒ දැන්වීමේ දින සිට දින හතක් ඇතුළත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව.

30. (1) 29 වැනි වගන්තිය යටතේ වූ අභියාචනයක් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ලද අවස්ථාවක දී, ඔහු විසින් හෝ ඔහු විසින් පත්කරන කොමසාරිස්වරයාගේ තනතුරට සමාන හෝ කොමසාරිස්වරයාගේ තනතුරට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් කරන ලද පරීක්ෂණයකින් පසුව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පහත සඳහන් ක්‍රියාවලි අතුරින් එකක් අනුගමනය කළ යුතුය. අභියාචන පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය.

(අ) ලියාපදිංචිය අවලංගු කිරීම තහවුරු කිරීම.

(ආ) ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වූ කොමසාරිස්වරයාගේ තීරණය නිශ්ප්‍රභා කිරීම.

(2) අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගනු ලැබූ තීරණය කොමසාරිස්වරයා වෙත ද පිටපතක් සහිත ව අභියාචනය ලැබුණ දින සිට මසක් ඇතුළත දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්වරයා වෙත ලිඛිතව දන්වා යැවිය යුතුය.

31. 30 (1) වැනි උප වගන්තිය යටතේ දෙන ලද තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියටපත් පාර්ශ්වකරුවෙකු විසින් ඒ තීරණයේ දින සිට දින හතක් ඇතුළත අවසාන තීරණය සඳහා අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව.

32. 31 වැනි වගන්තිය යටතේ අභියාචනයක් ලද විටකදී, අමාත්‍යාංශ ලේකම්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ඒ අභියාචනය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර එම පරීක්ෂණයේ වාර්තාව අනුව අමාත්‍යවරයා විසින් 30(අ) හෝ (ආ) ඡේද යටතේ තම තීරණය කොමසාරිස්වරයා වෙත ද පිටපතක් සහිත ව අභියාචනය ලැබුණ දින සිට මසක් ඇතුළත දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්වරයා වෙත ලිඛිත ව දන්වා යැවිය යුතුය. අභියාචන පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය.

## V වන කොටස

### දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිති නියම කිරීම

33. දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වා ගෙන යන කාල සීමාව, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පරිශ්‍රයේ භෞතික පහසුකම්, ළමයින්ගේ වැඩ සැලැස්ම, වාර්තා පවත්වා ගැනීම, අවම කාර්යය මණ්ඩලය හා ළමයින්ගේ සුබසාධනය සඳහා අවශ්‍ය යැයි හැඟී යන කරුණු සම්බන්ධයෙන් අදාළ ප්‍රමිතීන් නියම කිරීම සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය යුතුය. මණ්ඩලය විසින් ප්‍රමිතීන් සම්බන්ධ ව රීති සෑදිය හැකි බව.

34. දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුර සඳහා රීති මගින් නියම කරනු ලබන අවශ්‍ය අවම ප්‍රමිතීන් ඇත්නම් මිස, යම් තැනැත්තකු දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ එකී තනතුරකට පත්කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතුය. කාර්යය මණ්ඩලය සඳහා සුදුසුකම්.

35. මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද සියලු දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්යය මණ්ඩලයේ නම් හා සුදුසුකම් ඇතුළත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය සඳහා වූ රෙජිස්ටරයක්, කොමසාරිස්වරයා විසින් පවත්වා ගෙන යා යුතුය. කාර්ය මණ්ඩලය සඳහා රෙජිස්ටරයක් පවත්වා ගෙන යා යුතු බව.

කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා පවත්වනු ලබන ආයතනයක් පවත්වාගෙන යා යුතු බව.

36. කොමසාරිස්වරයා විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් පවත්වනු ලබන ආයතනයක් තමා යටතේ පවත්වා ගෙන යනු ලැබිය යුතුය.

කාර්යය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා පවත්වනු ලබන පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යායුතු බව.

37. 36 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ආයතනය මගින් මෙහෙයවනු ලබන පාඨමාලා වෙනුවට හෝ එම පාඨමාලාවන්ට අමතරව දිවා සුරැකුම් මධ්‍යස්ථාන කාර්යය මණ්ඩල සාමාජික සාමාජිකාවන් හැදෑරීම සුදුසු බවට මණ්ඩලය විසින් පිළිගනු ලබන පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලබන පෞද්ගලික අධ්‍යාපන ආයතනවල නම් හා පාඨමාලා තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් කොමසාරිස්වරයා විසින් පවත්වා ගෙන යා යුතුය.

## VI වන කොටස

### වැරදි සහ දඬුවම්

වැරදි.

38. යම් තැනැත්තෙකු විසින් හෝ පුද්ගල කමිටුවක් විසින්,

(අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීම, ප්‍රඥප්තියේ පරමාර්ථවලට පටහැනි ලෙසින් මුදල් යෙදවීම, මුදල් අයථා පරිහරණය;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ කරන ලද යම් නියෝගයක් අනුව සැපයිය යුතු යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හැර ඇති අවස්ථාවක දී;

(ඇ) සපයනු ලබන තොරතුරක හෝ වාර්තාවක දැනුවත්වම ව්‍යාජ තොරතුරු ඇතුළත් කර ඇති අවස්ථාවක දී;

(ඉ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ කරන ලද යම් නියෝගයකට හෝ විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී;

ඒ තැනැත්තා හෝ ඒ පුද්ගල කමිටුවේ එක් එක් සාමාජිකයා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

දණ්ඩන.

39. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන තැනැත්තෙකු, ඒ වෙනුවෙන් වෙනත් යම් නීතියක් යටතේ විශේෂිත දඬුවමක් පැනවීමට විධිවිධාන සලසා නොමැති නම්, වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් 25,000 කට නොඅඩු දඩයකට හෝ මාස 03 නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

## VII වන කොටස

### පොදු විධිවිධාන

නියෝග සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය.

40. (අ) මේ ප්‍රඥප්තියේ විධානයක් ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර ඒ පළකිරීමේ දින හෝ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(ඇ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, අනුමතය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එම අනුමතයේ දින සිට පරිච්න්න කරන ලද ලෙස සලකනු ලැබිය මුත්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් අගතියක් නොවිය යුතුය.

රීති සෑදීමට කමිටුවට ඇති බලය.

41.(අ) මේ ප්‍රඥප්තිය යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකිය.

(ආ) මණ්ඩලය විසින් සාදනු ලබන රීති අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින හෝ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ බලාත්මක විය යුතුය.

**42. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,**

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා අදහස් වේ;

"දෙපාර්තමේන්තුව" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව අදහස් වේ;

"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ පිහිටුවන ලද දකුණු පළාත් සභාව අදහස් වේ;

"ළමයා" යන්නෙන් වයස මාස 4 සිට අවුරුදු 12 දක්වා තැනැත්තකු අදහස් වේ ;

"විශේෂ අවශ්‍යතා සහිත ළමයා" යනුවෙන් 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන් ලියාපදිංචි කිරීමේ පනතේ "ආබාධ සහිත තැනැත්තා" යන්නට දී ඇති අර්ථය යටතේ සඳහන් තත්ත්වයට පත් ව සිටින වයස මාස 4 සිට අවුරුදු 12 දක්වා තැනැත්තෙකු අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ සාදන නියෝග මගින් නියම කර ඇති බව අදහස් වේ.

43. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව අර්ථ නිරූපණ.

03 - 1163

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.